## සොයුරියකගේ හදින්



*මොන විදිහට ලෝකය වෙනස් වී තිබුණත් කොපමණ තාක්ෂණික පහසුකම් ලැබුනත් අපේ මිනිස්සු තවමත් යටි හිතින් පතන්නේ, ඇලුම් කරන්නේ මේ සාම්ප්‍රදායික ගැහැනියටම තමයි.*

බොහෝ වැඩ කටයුතු නිසා පසුගිය මාස දෙක තුළ ඔබ අමතන්නට නොහැකි වුණා. පමා වී හෝ ඔබට සුබ නව වසරකට ආසිරි පතනවා. ඉතින් අපි නැවතත් කථා කරමු.

මේ මාර්තු මාසෙදීම ඔබව අමතන්න ලැබීම සතුටක්. අමතකද? මාර්තු 8 කියන්නේ අපේ දිනය. ''ජාත්‍යන්තර කාන්තා දිනය'' දහසක් දුක්විඳින කාන්තාවන්ට වෙන් කෙරුණ මේ දිනයේ අපි ගැන කතා නොකර කොහොමද? දිනය ජාත්‍යන්තර උනත් අපිට කතා කරන්න වෙන්නේ ලංකාවේ අපේ කාන්තාව ගැනම තමයි. අපට වඩා ගව් ගණනක් දුරින් යුරෝපීය හා බටහිර කාන්තාවන් අයිතීන් හා වගකීම් වලින් ඉදිරියෙන් නිසා වෙලා ''චමිලා''ට පත්වෙන කාලය තුළ ඒ අහිංසකීවම යට ඇඳුමේ ඉඳලා යන්ත්‍ර සූත්‍ර, කෑම බීම දක්වාම අලෙවි කරන්න යොදන සංකේතයක් බවට පත්වෙලා ඉවරයි. ඒ සමගම කර වටේ සිට වළලු කර දක්වා ආවරණය වූ ඈ තනපටේ සිට බිකිනිය දක්වා නිරාවරණය වී හමාරයි.

කාන්තාවන් දුටු විට සලකන, ගෞරව කරපු මිනිසා ඇය දුටු තැන සිතින් හෝ ලිංගික තෘප්තියක් මානසිකව විඳින අයෙකු බවට පත්වී හමාරයි. ඉතින් සමාජය මේසා පරිවර්ථනයකට හසුවී තිබෙන කාලෙක එක් සාමාජිකයෙක් පමණක් ඉන් බේරී සිටින්නේ කොහොමද? අන්න ඒ ගැලවීම උදෙසා තමයි ලොව වටා කාන්තාවන් වෙනුවෙන් දිනයක් වෙන්වී ඇත්තේ. මේ දිනය සැමරීම පමණක් මදි. එය කාන්තාවන් දැනුවත් කිරීම උදෙසා යොදා ගත යුතුයි. ලිප්ටන් වට රවුමේ හෝ 222 රේඩියෝවට පැමිණ කථා කිරීමෙන් හෝ සීත කාමර තුළ හිරවී සිටීමෙන් පමණක් මේ දේවල් කළ නොහැකියි. මං මෙහෙම කියන කොට ඔබට සිතේවී අපේ කාන්තාව ඉදිරියට ඇවිත් නැද්ද කියා. ඇත්ත, ඇවිත් ඉන්නවා තමයි. ඒත් ඉතා සීමිතව පමණයි. කාන්තාවක් අගමැති, ජනාධිපති වුණා තමයි. ඒවා අහම්බයන් පමණයි. අදටත් ප්‍රතිශතයක් වශයෙන් ගත්තොත් රැකියා ක්ෂේත්‍රයේදී ඇඟලුම් කර්මාන්තයේදී පමණයි කාන්තාව ඉදිරියෙන් ඉන්නේ. අනෙක් සෑම තැනකම ඉන්නේ පසු පසින්. මේක

# පරමාදර්ශී කාන්තාව සොයා....

එයාලව ටිකක් අමතක කරමු. ලංකාවේ කාන්තාව කිව්වම ඒක මුළු ආසියාකරේටම පොදුයිනේ.

අපි ඇත්තටම අපේ කාන්තාව සරලව අර්ථ දක්වන්නේ කොහොමද? උදේ පාන්දරින් අවදි වී සැමියාගේ හා දරුවන්ගේ උදේ තේ කෝප්පයේ පටන්, කෑම බීම, ඇඳුම් පැලඳුම් සූදානම් කරදෙන, ලෙඩට දුකට නිදිවරන, ගමක නම් දහසක් ගෙදර දොරේ වැඩ පල අතරේ කුඹුරේ හේනේ වැඩවලට උදව් වන, සියළු කටයුතු නිමා වී සියල්ලන්ටම පසු නිදි පැදුරට යන කාන්තාව තමයි අපි දන්නේ. මොන විදිහට ලෝකය වෙනස් වී තිබුණත් කොපමණ තාක්ෂණික පහසුකම් ලැබුනත් අපේ මිනිස්සු තවමත් යටි හිතින් පතන්නේ, ඇලුම් කරන්නේ මේ සාම්ප්‍රදායික ගැහැනියටම තමයි. ඒත් මේ ගැහැනිය අද වෙනවිට ඉතිරි වෙලා ඉන්නවාද කියන එක ප්‍රශ්නයක්. එයින් අදහස් වෙන්නේ ලෝකයේ දියුණුවත් සමඟ කාන්තාවත් දියුණු වී ඉදිරියට ගොස් ඇති බවද? සත්තකින්ම නැහැ. සිදුවෙමින් පවතින්නේ බාහිර වෙනසවීම් පමණයි. අපි දැකපු ගැහැනිය දැන් බොහෝවිට හමුවන්නේ පොත්වල චරිත තුළ පමණයි. ඈත හද්ද පිටිසර ගැහැනිය පවා සීඝ්‍ර පරිවර්ථනයකට හසුවෙමින් සිටිනවා.

බොහෝ දෙනා ගැහැනියගේ මේ වෙනස්වීමට සමාජයට, එෆ්.එම්.. ගුවන් විදුලියට, රූපවාහිනියට දොස් පවරනවා. ඒත් මට නම් හිතෙන්නේ ඒ සේරම බාහිර සාධකයන් පමණක් ලෙසයි. ප්‍රධාන වශයෙන්ම අප වගකිවයුත්තේ අපටමයි යන්නයි මගේ විශ්වාසය. පසුගිය කාලයේ ලංකාවේ මා දුටු පරිසරය නම් හිතා ගන්න බැරි තරමට වෙනස් වෙලා. කාන්තාවගේ විලාසිතා, ඇඳුම් පැළඳුම්, ඉරියව්, ගමන් බිමන් කොපමණ නම් පරිවර්ථනයකට හසුවෙලාද? පාරිභෝගික සමාජයක් වේගයෙන් ඉදිරියට ගමන් කරන කොට, මේවා නතර කරන්නේ කොහොමද? ඔබට මතකද අප පාසල් යන අවදියේදී තමයි මුලින්ම මේ වෙනස්වීම් අපට දැනෙන්න ගත්තේ. ඒත් ඒ කොපමණ සෙමින්ද? ඒ කාලයේ තරුණිය, යුවතිය, දැරිය, ගැටිස්සි උන ගෑනු ළමයි පසු කාලයේදී ''කෙල්ල'' වෙනවා. අපේ කාලයේදී තමයි මේ කෙල්ල කාගේ හරි ''ගැලක්' හෝ ''කරත්තේ'' වෙන්නේ. මේ ''කරත්තේ'' අපේ පාසල් අවදිය නිමා වෙනවිට ''බඩුව'' වෙනවා. පසු කාලයේදී මේ ''බඩුව'' ''ගෙඩිය'' බවට පත් වෙනවා. ඉතා ඉක්මණින් මේ ''ගෙඩිය'' ''කෑල්ල''ක් ලෙසට පරිවර්ථනය වෙනවා. මෑත කාලයේදී මේ ''කෑල්ල'' ''මස'' බවට හැරී නැවතත් ''තෙල් කෑල්ල'' වෙලා කාලය ඉක්ම ගියාට පසු ''චමිලා'' ලෙසට නම් ගන්නවා. බලන්න අපේ සමාජය කාන්තාවට ආමන්ත්‍රණය කරන ආකාරය. ගෙදර බුදුන් චමිලා වුන අයුරු කොපමණ කණගාටුදායකද? ඇත්තටම මේවා මෙහෙම වුනේ මේ කාල පරාසය තුළ සිදුවන බොහෝ සමාජ පරිවර්තනවලට සමගාමීවයි. අර දැරිය ''තෙල''

අපේ රටට පමණක් නොවෙයි ආසියාවටම පොදු කාරණයක්. කාන්තාව ඉදිරියට ගන්න, දැනුවත් කරන්න, කාන්තා දිනයකදී ලංකාවේ පවතින කාන්තා සංවිධානවලට ලොකු වගකීමක් තියෙනවා. ඇත්තටම කාන්තා සංවිධානයක් කිව්වම අපේ හිතේ මැවෙන්නේ මොන වගේ චිත්‍රයක්ද? නාගරික පන්නයේ, පොහොසත්, තරබාරු නෝනලා ටිකක් හා නවීන වාහන ටිකක් නේද? මේ වාහනවල නැගී ගම්මානවලට ගොස් කුමක් හෝ බෙදා දී වැඩමුළු පවත්වන කණ්ඩායම් ලෙසයි ඔවුන් හංවඩු ගැසී ඇත්තේ. මේ කාන්තා සංවිධානත් සමගම එකට යන වචන සෙට් එකකුත් තියෙනවා. ස්ත්‍රීවාදය, පුරුෂාධිපත්‍යයට එරෙහිවීම, ලිංගික හිංසනයන්ට එරෙහිවීම, මේ හංවඩුවම මොනතරම් කණගාටුදායක තත්ත්වයක්ද? සමහර විට අතරින් පතර හොඳ සංවිධානත් ඇති. ඒත් මූලික වශයෙන්ම මේ කාන්තා සංවිධානවල කාර්ය භාරය විය යුත්තේ පවුල් ප්‍රශ්න ලිංගික ප්‍රශ්න වැනි පෞද්ගලික ප්‍රශ්න ගැන නොව, කාන්තාව නොමඟ යවන බලවේග ගැන ඇය දැනුමෙන් පෝෂණය කිරීමයි. සියළු අසාධාරණයන්ට විරුද්ධව ඇය සංවිධානාත්මකව පෙල ගැස්වීමයි, නුගත්කමේ අඳුරුපට ඉරා උගත්කමේ දීප්තිමත් හිරු දහර වෙත ඇය යොමු කිරීමයි, අයිතිවාසිකම් දිනා ගැනීමට ඇය මානසිකව ශක්තිමත් කිරීමයි. අපේ අවාසනාවට නොවන්නේද එයමයි. වනිතාවන්ට වෙනමම අමාත්‍යාංශයක්ද ඇති රටක වනිතාවන් අපි. ඒ ඉතිං සිදුවන්නේ කලාපෙට ඉල්ලුම සපයන එකයි, මැද පෙරදිග පටවන එකයි, හමුදා සේවයට යන එක පමණයි. අඩුම තරමේ මැද පෙරදිගදී අසරණ වී ආපසු එන සහෝදරියනට සෘජුව උදව් කළ හැකි එක කාන්තා සංවිධානයක් හෝ බිහිවෙනවා නම් බත් පැකට් බෙදන, ගංවතුර, නියං ආධාර දෙන සංවිධාන 100ක් බිහිවෙනවාට වඩා හොඳයි. ජයේ නම් කියන්නේ ඕක කරන්න නම් ක්‍රමේම වෙනස් කරන්න ඕනේ කියලා.

**ධරණී**

---





අමා දහර සමඟින් නර්තනයේ නව මංපෙත් සොයා.

## අමා සිරිවර්ධන සමඟ සාකච්ඡාවක්

නර්තනය අප සමාජයේ විවිධ තරාතිරම් වල දෙමාපියන් අතර එක සේ වැදගත් අංගයක් බවට පත්ව ඇති බව දිනෙන් දින අපට පෙනී යයි. ශාස්ත්‍රාණුකූලව සිය දරුවනට මෙවන් සංස්කෘතිකාංග ඉගැන්වීමට අපේ දෙමාපියන් පෙළඹීම යහපත් ප්‍රවණතාවක් ලෙස අපි දකිමු.

අමා සිරිවර්ධන මෙරට නර්තන අධ්‍යාපනයේ ඉහළින්ම කියැවෙන නමකි. ඇගේ අමා දහර නර්තන ප්‍රසංගය අප්‍රේල් 1 වන දින පැවැත්වීමට සියළු කටයුතු යොදා ඇත. අප සමඟ කළ සාකච්ඡාවේදී ඇය මෙසේ අදහස් දැක්වූවා ය.

අද වන විට ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව අතර තම දූ දරුවන් ශ්‍රී ලාංකික සංස්කෘතිකාංග කෙරෙහි වඩා යොමු කිරීමේ ප්‍රවණතාවක් දකින්නට තියෙනවා. එහි අතුරු ඵලයක් ලෙස නර්තනය කෙරෙහි නැඹුරු වීම අද අපට දක්කනට හැකි ව තිබෙනවා. නමුත් ශ්‍රී ලංකාව තුළ මේ තත්වය මේ ලෙසින්ම දකින්නට අපහසුයි. රූපවාහිණියේ සම්ප්‍රාප්තියත් සමග රූපවාහිනී ප්‍රසංග වේදිකාවට නැතුවම බැරි අංගයක් ලෙස නැටුම් කලාව ඉදිරියට පැමිණ තිබෙනවා. මෙනිසා තම දූ දරුවන් රූපවාහිණී නැටුම් දර්ශණ ඉදිරිපත් කරනු දකින්නට කැමැත්තක් සහ තරගයක් අද වන විට ඇතිවී තිබෙනවා. නමුත් ඔස්ට්‍රේලියාවේ වෙසෙන බොහෝ දෙමාපියන්ට මෙවැනි පටු අදහසක් නැහැ. ඔවුන් හැමවිටම උත්සාහ කරන්නේ තමුන්ගේ දුවා දරුවන්ට අපගේ කලාව හා සංස්කෘතිය ශාස්ත්‍රාණුකූලව ඉගැන්වීමටයි. කලාව සාහිත්‍යයට පෙළඹීම තුළ අපේ දරුවන්ගේ හැදියාව මානසික සෞඛ්‍යය වර්ධනය වෙනවා.

ඔස්ට්‍රේලියාව වැනි බහු සංස්කෘතික සමාජයක ළමයින් වැරදි මාර්ග වලට වැටීමේ ඉඩ ප්‍රස්ථාව වැඩියි. නමුත් කලාව සංස්කෘතිය හදවතට දැනෙන කෙනෙක් වැරදි මාර්ගයකට නොයන බව විශ්වාසයි.

මම මෙවර මෙම නර්තන ප්‍රසංගයෙන් බලාපොරොත්තුවන්නේ අලුත් යමක් කිරීමටයි. මෙම ප්‍රසංගයට සම්ප්‍රදායික උඩරට නැටුම් සමගින් භරත නාට්‍ය නව නිර්මාණ නැටුම් පහත රට නැටුම් ඉදිරිපත් කරනවා. මෙවර ප්‍රසංගයේදී වැඩි ප්‍රමුඛතාවක් දෙන්නේ නව නිර්මාණ වලටයි. මෙම ප්‍රසංගයට අවුරුදු හතරේ සිට පනහ දක්වා පමණ වන අය සහභාගි වනවා. මම එහෙම කියන්නේ ශ්‍රී ලංකවෙන් මෙහාටෙ සංක්‍රමණය වූ බොහෝ දෙනෙක් නැටුම් කලාව හදාරා තිබෙන නිසයි. ඒ අයට තමන් හැදෑරූ නැටුම් කලාව අමතක වී යනවා. එසේ අමතක වූ වැඩිහිටියන් කීප පොලක් මා සමග නැටුම් පුහුණු වෙනවා. ළමයින් සමග මෙම ප්‍රසංගයට ඔවුගේ අංගත් එකතු වෙනවා. දැනට මා යටතේ ළමුන් 130 ක්මණ නැටුම් පුහුණු වෙනවා. මේ අයට මම මුල සිටම ශාස්ත්‍රාණුකූලව මා ඉගෙනගත් සියලුම නැටුම් කලාවන් උගන්වනවා.

මම භරත නාට්‍ය පද්මිණී දහනායක මහත්මියගෙන් ද උඩරට නැටුම් කලාව පියසර ශිල්පාධිපති මහතාගෙන් ද කුලසිරි බුදවත් මහතාගෙන් ද ඉගෙනගෙන තිබෙනවා. මගේ අරංගේත්‍රම් ප්‍රසංගය 1997 එල්ෆින්ස්ටන් රඟහලේදී පැවැත්තුවා. මම විශ්ව විද්‍යාල අධ්‍යාපනයෙන් පසු ගේට් වේ ජාත්‍යන්තර පාසලේ නැටුම් ගුරුවරිය ලෙස 2004 දී ඔස්ට්‍රේලියාවට පැමිණෙන තෙක් සේවය කලා.

1998 හා 99 වර්ෂ වල භරත නැටුම් සඳහා යව්වන සම්මාන මම දිනාගත්තා. 1999 රාජ්‍ය මුද්‍රා නාට්‍ය උළෙලේ සෝමා විජේසේකර විසින් නිෂ්පාදනය කළ විහඟ ගීත මුද්‍රා නාට්‍යයෙන් මට සම්මාන ලැබුණා. දැනට මම ඔස්ට්‍රේලියාවේ පාසල් වල අපේ නැටුම් කලාව ගැන මෙහි වෙසෙන ළමුන්ට කියා දෙනවා. ඒ අය අපේ නැටුම් කලාවට දැඩි කැමැත්තක් තිබෙනවා.

මේ වසරේ අපගේ අමා සිරිවර්ධන රංගායතනය ඉදිරිපත් කරන නර්තන ප්‍රසංගය අප්‍රේල් 1 වන දින බර්වුඩ් හි බෙසන් සෙන්ටර් හිදී සවස 6 සිට පැවැත්වෙනවා. සම්ප්‍රදායික හා නව නිර්මාණ ඉන්දියානු ජන නැටුම් උඩරට හා පහතරට නැටුම් මෙම ප්‍රසංගයේ දී අප ඉදිරිපත් කරනවා. මෙම ප්‍රසංගය ඔබ මෙතෙක් නැරඹූ ප්‍රසංග වලට වඩා වෙනසක් ඇති ප්‍රසංගයක් බවට පත් වන බව මට විශ්වාසයි.

සටහන ශ්‍රීනාත් මද්දුමගේ